# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2103/18 - 2018 දෙසැම්බර් මස 27 වැනි බ්‍රහස්පතින්දා - 2018.12.27

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කරගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මාගේ යොමු අංකය:* 4/1/ඉ/අත්පත්/87/2016(DIVML/13/2018).
*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය:* 4-3/ 7 /2016/එච්ඩබ්ලිව් /310.

පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම් රජයට අත්කරගෙන ඇත. ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වන වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් මහජනතාවගේ දැනගැනීම සඳහා මෙයින් දැනුම් දී සිටිමි.

*අත්කරගෙන ඇති ඉඩමේ විස්තරය :*

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, මල්ලවපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 715, හැවන ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, හැවනවත්ත ගමේ පිහිටි සර්වේ ජනරාල් වෙනුවෙන් කුරුණෑගල කොට්ඨාසය භාර ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරී විසින් පිළියෙල කරන ලද අංක 420204, කලාප අංක 01, පත්‍ර අංකය 10 හා 2018.12.17 දරන කැඩැස්තර සිතියමේ කැබලි අංක 304, 305, 308, 309, 310, 311 හා 314 වූ ප්‍රමාණයෙන් හෙක්ටෙයාර් 0.4893 ක් වූ පහත විස්තර කර ඇති ඉඩම් කැබලි හත(07).

01. කැබලි අංක 304
ඉඩමේ නම:නොදනී;ඉඩම් පරිහරණය:ඇළ; හිමිකම් පාන්නා:රජය;මුල් හිමිකම් පාන්නා:නොදනී; ප්‍රමාණය: හෙක්. 0.0115.

02. කැබලි අංක 305
ඉඩමේ නම:හොම්මාරපිටිය;ඉඩම් පරිහරණය: කුඹුර; හිමිකම් පාන්නා:රජය;මුල් හිමිකම් පාන්නා:දේවතා පෙජ්ජලාගේ සුරනිමල; ප්‍රමාණය: හෙක්. 0.0432.

03. කැබලි අංක 308
ඉඩමේ නම:හොම්මාරපිටිය;ඉඩම් පරිහරණය: කුඹුර; හිමිකම් පාන්නා:රජය;මුල් හිමිකම් පාන්නා:දේවතා පෙජ්ජලාගේ සුරනිමල; ප්‍රමාණය: හෙක්. 0.0332.

04. කැබලි අංක 309
ඉඩමේ නම:හොම්මාරපිටිය;ඉඩම් පරිහරණය: කුඹුර; හිමිකම් පාන්නා:රජය;මුල් හිමිකම් පාන්නා:හොරතල්ගේ ජයසිංහ; ප්‍රමාණය: හෙක්. 0.1700.

05. කැබලි අංක 310
ඉඩමේ නම:හොම්මාරපිටිය;ඉඩම් පරිහරණය: කුඹුර; හිමිකම් පාන්නා:රජය;මුල් හිමිකම් පාන්නා:දිසානායක මුදියන්සේලාගේ සිසිර රෝහන දිසානායක; ප්‍රමාණය: හෙක්. 0.1208.


1A - G 29152 - 17 (2018/12)



මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

06. **කැබලි අංක 311**

ඉඩමේ නම:හැවන කුඹුර;ඉඩම් පරිහරණය: කුඹුර; හිමිකම් පාන්නා:රජය;මුල් හිමිකම් පාන්නා:දේවතා පේජ්ජලාගේ ශිරෝමි දර්ශිකා; ප්‍රමාණය: හෙක්. 0.0766.

07. **කැබලි අංක 314**

ඉඩමේ නම:හොම්මාරපිටිය;ඉඩම් පරිහරණය: කුඹුර; හිමිකම් පාන්නා:රජය;මුල් හිමිකම් පාන්නා:දිසානායක මුදියන්සේලාගේ පුෂ්ප ජයනන්ද දිසානායක; ප්‍රමාණය: හෙක්. 0.0340.

මෙම ඉඩම් කැබලි සඳහා අයිතිවාසිකම් කියන සියලු දෙනාම තම තමන්ගේ නම් *ගැසට්* පත්‍රයේ පළවී ඇතත්, නැතත් එම ඉඩම් සම්බන්ධයෙන් තමන්ට ඇති අයිතිවාසිකම්, එක් එක් බිම් කැබැල්ල වෙනුවෙන් වෙන වෙනම, පිටපත් දෙකකින් යුත් ලියවිල්ලකින් එම ඉඩම්වලට ඇති ස්වකීය අයිතියේ ස්වභාවය හා එම ඉඩම් කැබලිවල අයිතිය වෙනුවෙන් තමන්ට ඉදිරිපත් කළ හැකි සාක්ෂි, වන්දි මුදල හා එය ගණන් බැලූ ආකාරය පිළිබඳ විස්තරයන් 2019.01.07 දින මගේ කාර්යාලයේ දී මා හමු වී ඉදිරිපත් කරන ලෙස මෙයින් දැනුම් දෙනු ලැබේ.

ඒ අනුව 2019.01.22 දින සිට මා විසින් දැනුම් දෙනු ලබන දිනයකදී තමන් විසින්ම නැතහොත් ලිඛිතව බලය පවරනු නියෝජිතයකු මගින් නියමිත දින නියමිත වේලාවට, අදාළ ඔප්පු හා මා විසින් නියම කරනු ලබන අනෙකුත් ලියවිලි සමඟ මා විසින් නියම කරනු ලබන ස්ථානයකදී පනතේ 09 වෙනි වගන්තිය යටතේ හිමිකම් පරීක්ෂණය සඳහා ඉදිරිපත් විය යුතුය.

පරීක්ෂණය සඳහා නියෝජිතයෙකු ඉදිරිපත් කරන්නේ නම් ඉඩම් හිමිකම් කියන්නා විසින් බලය පවරන ලද ලිපියක් නොමැතිව ඔහුගේ/ඇයගේ ප්‍රකාශ හෝ සාක්ෂි සටහන් කරගනු නොලබන බව අවධාරණය කරමි.

ආර්. එම්. පී. රත්නායක,
ප්‍රාදේශීය ලේකම් හා ඉඩම් අත්කර ගැනීමේ නිලධාරී,
මල්ලවපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය.

2018 ක් වූ දෙසැම්බර් මස 24 වැනි දින,
මල්ලවපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

01 - 218

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.